**මහජන බැංකුව එහි පරිපාලිත සමාගම් - 2020**

**-------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 මතය**

**---------**

මහජන බැංකුවේ(“බැංකුව“)2020දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020දෙසැම්බර්31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, බැකුවේ එහි පරිපාලිත සමාගම්වල (“සමූහය“) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මුදල් පනතේ 5(1) වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාරව 1992 මැයි 14 වන දින අංක 715 දරන රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශනයට පත් කර ඇති මුදල් අමාත්‍යවරයාගේ නියෝගයක් මඟින් 1971 අංක 38 දරන මුදල් පනතේ II කොටසේ සඳහන් විධිවිධානවලින් බැංකුව නිදහස් කර ඇත.

බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3.1 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**----------------------------------------------------------------------------------------------------**

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලටඅනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව හා සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය බැංකුව හා සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
බැංකුව හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, බැංකුව හා සමූහයේවාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා සමාගම හා සමූහය විසින් පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂයපථය

-------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරී මෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස බැංකුවේ හා සමූහයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන්හෝතත්ත්වයන්හේතුවෙන්බැංකුවේ හා සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත බැංකුවේ හෝ සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බ වසහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැළසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලවබැංකුව ක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලවබැංකුව කටයුතු කර ඇති බව,
- සම්පත්සකසුරුවම්ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව බැංකුවප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධ විගණන නිරීක්ෂණ

### 1.5.1. අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ. අවිනිශ්චිත ගිණුම- අපේක්ෂිත යැවීම මතසැපයුම්කරුවන්ට ගෙවූ මුදල | | |
| රු.මිලියන1,643 ක සමුච්චිත වූ ශේෂයක් නිරවුල්කිරීමකින් තොරව වසර දෙකකටත් වඩා හිඟව පැවතුණි. | සටහන් කර ගන්නා ලදි. මෙම කරණය 2022 සැප්තැම්බර් 30 දිනට පෙර විසඳා ගැනීමට ඉලක්ක කර ඇත. | එම ශේෂ පිළිබඳ නිසි තක්සේරුවක් කිරීම හා හැකි ඉක්මනින් නිරවුල් කිරීම අවශ්‍ය වේ. |
| ආ. අවිනිශ්චිත ගිණුම - ඉදිකිරීම් ගිවිසුම් මත රඳවාගත් මුදල් | | |
| එකතුව රු.මිලියන 56.3 ක් වූ ශේෂයෙන් රු. මිලියන 22.6 ක් හෙවත් සියයට 40 ක් වසර 3 වඩා කාලයක් තිස්සේ නොපියවා පැවතුණි. | සටහන් කර ගන්නා ලදි. කොන්ත්‍රාක්කරුවන් දැනුවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. 2022 දෙසැම්බර් 31 දිනට පෙර නිරවුල් කිරීමට ඉලක්ක කර ඇත. | හැකි ඉක්මනින් නිරවුල් කිරීම අවශ්‍ය වේ. |

## 1.6 හෙළිදරව් නොකරන ලද සම්බන්ධිත පාර්ශවයන් හා සම්බන්ධිත පාර්ශව ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ.බැංකුව ප්‍රධාන කළමනාකරණ පිරිස්වල සමීප පවුලේ සාමාජිකයන් හා ඔවුන්ගේ සම්බන්ධ ආයතනවල විස්තර යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලියශක්තිමත් කිරීම හා අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ.<br>ආ දැනට, මූලික බැංකු පද්ධතිය හරහා සිදුකරනු ලබන සියලු සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හඳුනාගැනීමට ක්‍රියාවලියක් බැංකුව යොදවා නොමැත. (සම්බන්ධ පාර්ශව ගනුදෙනු පසුපස යාම හා උපුටා ගැනීම) | සියලු සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හඳුනාගැනීමේ ක්‍රියාවලිය දැන් තවදුරටත් ශක්තිමත් කර ඇත. සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව්කිරීම්වලට සම්බන්ධ සියලු ඉදිරිපත්කිරීම් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අනුකූලතා) හා මණ්ඩලයේ ලේකම් හරහා ඉදිරිපත් කරයි. බැංකු පනත් විධානයේ විධාන 3(7)(i) ප්‍රකාරව, සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සම්බන්ධ හෙළිදරව් කිරීම්, මණ්ඩලයේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව හරහා කාර්තුමය ඉදිරිපත් කිරීම හා 2020 වාර්ෂික වාර්තාවේ ආයතනික යහපාලනය කොටසෙහි දක්වා ඇත. | විශේෂයෙන්ම ජාතික විගණන පනත බලාත්මකවීමසමඟ විවිධ රාමු/රීති ඒ යටතේ අවශ්‍යතාවයන් ආවරණයවන පරිදි සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හෙළිදරව් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අ) බලපත්‍රලාභී වාණිජ බැංකුවල ආයතනික යහපාලනය පිළිබඳ මහබැංකුව විසින් නිකුත් කරන ලද 2007 අංක 11 දරන බැංකු පනත් විධානය හා එයට අදාලවන පසුකාලීන සංශෝධනයන් | | | |
| (i)වගන්ති 3(1)(i)(i)(iii) | යහපත් පරිචයන් සම්බන්ධ සංග්‍රහයේ 2.21 වගන්තියට අනුව, ප්‍රධාන විධායක නිලධාරීගේ හා ප්‍රධාන කළමනාකරණ පිරිස්වල ස්වයං ඇගයීම්, මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු අතර එහි සමාලෝචනය සඳහා හා අවශ්‍යවන විට වෙනස්කම් නිර්දේශ කිරීමට හා අඩුපාඩු සහිත ක්ෂේත්‍ර සාකාච්ඡා කිරීමට සාරාංශයක් මණ්ඩලයට ඉදිරිපත් කළයුතු වුව ද, 2020 වර්ෂය සඳහා එවැනි ඇගයීම් මණ්ඩලයට ඉදිරිපත් කර නොතිබුණි. | සාමාන්‍යාධිකාරී/ප්‍රධාන විධායක නිලධාරීගේ ස්වයං ඇගයීම් හා 2021.01.01 සිට 2021.12.31 දක්වා වන කාලපරිච්ඡේදය සඳහා ප්‍රධාන කළමනාකරණ පිරිස්වල වගන්ති 3(6)(iii)(b), වගන්ති 3(6)(iii)(c),හාවගන්ති 3(6)(iv)(d) හි අවශ්‍යතා මාර්තු මාසයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කිරීමට නියමිතය. | වඩා හොඳ පාලනයක් සඳහා සෑම වර්ෂයකම ඉදිරිපත්කිරීම අවශ්‍ය වේ. |
| (ii)වගන්ති 3(6)(iii)(b) | ප්‍රධාන විධායක නිලධාරී හා ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අරමුණු හා ඉලක්ක මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවේ සලකාබැලීම සඳහා ලේඛනගත කළ යුතු වුවද, අධ්‍යක්ෂවරුන් හා ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා සලකා බලා නොතිබුණි. | ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරීගේ කාර්යයසාධනය, මණ්ඩලයේ මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුවට (BHRRC) ඉදිරිපත් කර ඇත. (BHRRC අංක 162/2021 හා 163/2021) | වඩාහොඳ පාලනයක් සඳහා මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව විසින් අධ්‍යක්ෂවරු හා ප්‍රධාන කළමනාකරණ පිරිස් ද සලකාබැලීම අවශ්‍ය වේ. |
| (iii)වගන්ති 3(6)(iii)(c) | බැංකුවේ ආයතනික හා විධායක කළමනාකරණය සඳහා නව කාර්යයසාධන ආකෘතියක් සංවර්ධනය කර තිබුණද (BHRRC අංක 104/2019), වඩා හොඳ පාලනයක් සඳහා තීරණය | කලින් තීරණය කරන ලද ඉලක්කවලට අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරීගේ ද්විමාර්ගික කාර්යයසාධන | වඩා හොඳ පාලනයක් සඳහාතීරණය කළ අරමුණු හා ඉලක්කවලට අනුව සලකාබැලීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| | කරන ලද අරමුණු හා ඉලක්කවලට එරෙහිව ප්‍රධාන විධායක නිලධාරීගේ හා ප්‍රධාන කළමනාකරණ පිරිස්වල කාර්යයසාධනය ඇගයීම් සලකාබැලීමට කමිටුව ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට තිබේ. | ඇගයීම් දැන් කරගෙන යනු ලබන අතර මේවා ඉදිරි මණ්ඩලයේ මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. | |
| (iv) වගන්ති 3(6)(iii)(d) | අධ්‍යක්ෂවරුන්ගේ හා ප්‍රධාන විධායක නිලධාරීගේ ප්‍රකාශන, නාම යෝජනා කමිටුව හරහා ඉදිරිපත් කර නොමැත. | අධ්‍යක්ෂවරුන්ගේ හා ප්‍රධාන විධායක නිලධාරීගේ ප්‍රකාශන ශ්‍රී ලංකා මහ බැංකුවට ඉදිරිපත් කිරීමට පෙර මාර්තු මාසයේ පැවැත්වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කිරීමට නියමිත වේ. | වඩා හොඳ පාලයන් සඳහා ඉදිරියට යමින්,අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශන, නාම යෝජනා කමිටුව හරහා ඉදිරිපත් කිරීමට ක්‍රියාමාර්ග ගැනීම. |
| ආ. 2016 අප්‍රේල් 29 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 03/2016 හි 2 වන ඡේදය | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අදාල රෙගුලාසි ප්‍රකාරව, රජයට අයත් ව්‍යාපාරවල සේවකයන් ඇතුළුව රාජ්‍ය නිලධාරීගේ උපයන විට ගෙවිය යුතු බද්ද, බදු සඳහා යටත් සේවක ඉපයීම්වලින් අඩුකළ යුතුය. කෙසේ වෙතත්, බැංකුව සහ මහජන බැංකුවේ සේවක සංගමය අතර අත්සන් කරන ලද සාමූහික ගිවිසුම මඟින් සේවකයින්ගේ ආදායම් බදු වගකීම සේවකයින්ගේ වැටුප්වලින් අඩු නොකර බැංකුව විසින් ගෙවීමට නියම කර ඇත. ඒ මත පදනම්ව, 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා රු. මිලියන 26 ක් උපයන විට ගෙවිය යුතු බදු ලෙස සේවකයන්ගේ ඉපයීම්වලින් අඩු නොකර සේවකයන් වෙනුවෙන් බැංකුව ගෙවා ඇත. | දශක දෙකකට වඩා වැඩි කාලයක් පුරා රාජ්‍ය බැංකු හා අදාල වෘත්තීය සංගම් අතර ඇතිකර ගත් සාමූහික ගිවිසුමේ, බැංකුව විසින් දරනු ලබන උපයන විට ගෙවිය යුතු බදු ස්ථිර නියම කිරීමක් වී ඇත. | අදාල රෙගුලාසිවලට අනුගතවීම අවශ්‍ය වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 21,226.7 ක බදු පෙර ලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ අනුරූප ලාභය රු. මිලියන19,666.2 ක් විය. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 1,560.5 කවර්ධනයක් නිරීක්ෂණය විය. මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බදු අහෝසිවීම හා එකතු කළ අගය

මත බදු අනුපාතය අඩුවීම හේතුවෙන් බදු වියදමේ අඩුවීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2. ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

**2.2.1** සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල විශ්ලේෂණයක් පසුගිය වර්ෂය සමඟ සසඳා, වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතයන් සහිතව පහත දැක්වේ.

| විස්තරය | විචලනය වැඩිවීම / (අඩු වීම) | විචලනය | විචලනය සඳහා හේතුව |
|---|---|---|---|
| | (රු.000) | % | |
| පොලී ආදායම | (6,996,692) | 3.7 | කර්මාන්තයේ පොලී අනුපාත අඩුවීම හේතුවෙන් 2020 දී පොලී ආදායම රු බිලියන 179 දක්වා සියයට 3.7 කින් අඩුවිය. |
| පොලී වියදම | (6,723,955) | 5.4 | තැන්පතු මත පොලී අනුපාත අඩුවීම හේතුවෙන් 2020 දී පොලී වියදම රු බිලියන 118 දක්වා සියයට 5.4 කින් අඩුවිය. |
| වෙනත් වියදම් | (1,888,714) | 11 | COVID 19 කාලපරිච්ඡේදය තුළදී පිරිවැය පාලනය කිරීම හේතුවෙන්, 2020 දී වෙනත් වියදම්රු බිලියන 15 දක්වා සියයට 11 කින් අඩුවිය. ආසන්න වශයෙන් හතරෙන් එකක අඩුවීමක් අලෙවි හා ප්‍රවර්ධන පිරිවැයට ගණනය වේ. |
| හානිකරණ වියදම | 3,079,148 | 36.3 | 1. ප්‍රධාන පාරිභෝගිකයකුගේ පැහැර හැරීමේ සම්භාවිතාව,ගණනය කරන ලද පැහැර හැරීමේ සම්භාවිතාවේ සිට ස්වෛරී ශ්‍රේණිගතකිරීම මත පදනම් පැහැර හැරීමේ සම්භාවිතාවදක්වා මාරු කරන ලදි.<br>2. විචක්ෂණභාවයේ මිණුමක් ලෙස තවත් පාරිභෝගිකයන් කිහිපදෙනෙකු අදියර 1 සිට අදියර 2 දක්වා ගෙන යන ලදි.<br>3. ආර්ථික සාධකයේ ගැලපීම ඉහලයාම |
| මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩ නැගීමේ බදු හා ණය ආපසුගෙවීම මත බදු | (5,058,309) | 56.8 | ජාතිය ගොඩ නැගීමේ බදු හා ණය ආපසුගෙවීම මත බදු අහෝසිවීම හේතුවෙන් 2019 දී පැවැති රු. බිලියන 8.9 සිට 2020 දී රු බිලියන 3.8 දක්වා සියයට 56.8 කින් අඩුවිය. |
| සේවක මණ්ඩල වියදම් | 228,293 | 1.2 | විශ්‍රාම පිරිවැය වැඩිවීම මූලික කොටගෙන සේවක මණ්ඩල වියදම් 2019 දී පැවැති රු. බිලියන 19.5 සිට 2020 දී රු බිලියන 19.7 දක්වා සියයට 1.2 කින් වැඩිවිය. |

## 2.3. අනුපාත විශ්ලේෂණය

-------------------------------

ලබාගත හැකි වූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ බැංකුවේ සමහර වැදගත් අනුපාත, ශ්‍රී ලංකා මහබැංකුව විසින් ප්‍රකාශිත ආංශික අනුපාත සමඟ සසඳා පහත දැක්වේ.

| **විස්තරය**<br>-------------- | **ආංශික අනුපාතය**<br>------- | **බැංකුව**<br>**2020**<br>--------- | <br>**2019**<br>-------- |
|---|---|---|---|
| **කාර්යසාධන අනුපාත** | | | |
| හිමිකම මත ප්‍රතිලාභය (ROE) % | 10.9 | 14.4 | 13.9 |
| වත්කම් මත ප්‍රතිලාභය (ROA) % | 1.0 | 1.0 | 1.1 |
| පොලී ආන්තිකය % | 3.1 | 3.0 | 3.2 |
| **වත්කම් ගුණත්ව අනුපාතය** | | | |
| දළ අක්‍රීය ණය අත්තිකාරම් (NPL) % | 4.7 | 3.2 | 3.3 |
| **ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත** | | | |
| ස්ථර1ප්‍රාග්ධනය (අවම10%) | 13.1 | 9.5 | 10.7 |
| මුළු ප්‍රාග්ධනය (අවම 14%) | 16.7 | 15.5 | 14.7 |
| **ව්‍යවස්ථාපිත අනුපාත** | | | |
| ද්‍රවශීල වත්කම් අනුපාතය (අවම අවශ්‍යතාවය 20%) | 33.8 | 25.61 | 21.7 |
| ද්‍රවශීලතා ආවරණ අනුපාතය (අවම අවශ්‍යතාවය 100%) | | රුපියල් - 166.82 සියලු ව්‍යවහාර මුදල් – 111.55 | රුපියල් - 160.80 සියලු ව්‍යවහාර මුදල්- 132.10 |

## 2. මෙහෙයුම් සමාලෝචනය

---------------------------------

### 3.1 ආර්ථික නොවන ගනුදෙනු

-------------------------------

| **විගණන නිරීක්ෂණය**<br>------------- | **කළමනාකරණයේ අදහස් දැක්වීම**<br>----------------------------- | **නිර්දේශය**<br>---------------------- |
|---|---|---|
| බැංකුව සමාලෝචන වර්ෂය තුළදී ව්‍යාපෘති 2 ක් වෙනුවෙන් සිල්වර් ලංකා ස්ට්‍රක්චර්ස් සර්විසස්සමාගම වෙත රු. 486,202 හාරු. 795,121 බැගින් අත්තිකාරම් මුදල් ගෙවා තිබුණ ද එම ව්‍යාපෘති අත්හැර දමා තිබුණි. | සටහන් කර ගන්නා ලදි. 2022 සැප්තැම්බර් 30 දිනට පෙර මෙම කාරණය විසඳීමට ඉලක්ක කර ඇත. | ගනුදෙනු ආර්ථිකභා ශක්‍ය බවකින් යුක්ත විය යුතුය. |

## 3.2 හඳුනාගත් පාඩු

**විගණන නිරීක්ෂණය** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය**

| අලාභ සිදුවීම | | 2020 | | | 2019 | |
|---|---|---|---|---|---|---|
| | සිදුවීම් සංඛ්‍යාව | වටිනාකම | මුළු වටිනාකමෙන් ප්‍රතිශතය | සිදුවීම් සංඛ්‍යාව | වටිනාකම | මුළු වටිනාකමෙන් ප්‍රතිශතය |
| | | රු. මිලියන | | | රු. මිලියන | |
| අභ්‍යන්තර වංචා | 1 | 0.43 | 0.06 | 1 | 4.9 | 5.80 |
| බාහිර වංචා | 181 | 735.5 | 95.5 | 311 | 52.63 | 62.31 |
| ගනුදෙනුකරු, නිෂ්පාදන (Product)ව්‍යාපාර පරිචයන් | 1 | 23.01 | 2.99 | 2 | 0.67 | 0.79 |
| භෞතික වත්කම්වලට හානිවීම | 4 | 0.51 | 0.07 | 20 | 2.05 | 2.43 |
| ව්‍යාපාර බිඳවැටීම් හා පද්ධති අසාර්ථකතා | 7 | 0.23 | 0.03 | 12 | 1.15 | 1.36 |
| ක්‍රියාත්මක කිරීම, බෙදා හැරීම හා ක්‍රියාවලි කළමනාකරණය | 96 | 10.5 | 1.36 | 121 | 23.06 | 27.3 |
| එකතුව | **290** | **770.18** | **100** | **467** | **84.46** | **100** |

- බැංකුවේ අලාභ සිදුවීම් සංඛ්‍යාව අඩු වුවද,"බාහිර වංචා" සහ "ගනුදෙනුකරු, නිෂ්පාදන හා ව්‍යාපාරපරිචයන්" යටතේ වර්ගීකරණය කරන ලද පිළිවෙලින් රු.මිලියන.718.395 හා රු.මිලියන.23.007ක ප්‍රධාන වංචා දෙකක් හේතුවෙන් පෙර වර්ෂයට සාපේක්ෂව අලාභ සිදුවීම්වල වටිනාකම සියයට 812 කින් වැඩි විය.
- ජපානයේ ස්වයංක්‍රීය ඉන්ධන බෙදාහරින්නකු (AFD) හරහා විශේෂිත වෙළඳ වර්ගීකරණ කේතවලින් (MCC) ආරම්භ වූ විදේශීය හරපත් ගනුදෙනු සැලකිය යුතු ප්‍රමාණයක් ඇතුළත් වන ඉහත දක්වන ලද වංචාව අදාල ගනුදෙනුකරුගේ ගිණුම්වලට හරකර නොමැති අතර ගිණුමේ පවතින ශේෂයට වඩා වැඩියෙන් ගනුදෙනු කිරීමට හැකිවිය.කාඩ්පත් පද්ධතියේ ඇති යම් යම් දුර්වලතා හා අභ්‍යන්තර පාලනයන් අනුගමනය නොකිරීම හේතුවෙන් මෙම වංචාසහගත ගනුදෙනු වළක්වා ගැනීමට හා අනාවරණය කර ගැනීමට බැංකුවට නොහැකි විය.
- "ගනුදෙනුකරු, නිෂ්පාදන හා ව්‍යාපාර පරිචයන්" යන කාණ්ඩය යටතේ වර්ගීකරණය කරන ලද ඉහත සඳහන් අලාභ සිදුවීම, සහල් මෝලක නිශ්චිත ජංගම ගිණුමක එකතුව රු. මිලියන 23.007 කට අදාල අවස්ථා 5 කදී භෞතිකව ඉදිරිපත් නොකළ චෙක්පත් එකතු කිරීමකට සම්බන්ධ වේ. විනිමය බිල්පත් ආඥාපනතට අනුව, චෙක්පතක හෝ චෙක්පත වෙනුවට අදාලකළ හැකි යමක පිළිබිඹුවකට (image) එරෙහිව එකතුකිරීමට/ගෙවීමට බාරගැනීම පනත උල්ලංඝණය කිරීමක් ලෙස සැලකේ. තවද, බැංකුව පිළිබඳව තබා ඇති විශ්වාසය කඩකිරීම හේතුවෙන් බැංකුවේ ප්‍රතිරූපයට හානි විය. ඒ අනුව, ලංකා සතොස ලිමිටඩ් මෙම සිදුවීම පිළිබඳව පැමිණිලි කර තිබීම හා බැංකුවේ පරිචය පිළිබඳව ඔවුන්ගේ දැඩි සැකය ප්‍රකාශ කර තිබීම මඟින් එය පැහැදිලි වේ. එබැවින්, විෂමාචාර ක්‍රියාවන් සම්බන්ධව කරන ලද නීත්‍යානුකූල ක්‍රියාවන්ගේ මඟහැරීම හා නොසැලකිල්ල මින් ප්‍රකාශ කරයි.

**කළමනාකරණයේ අදහස් දැක්වීම:**

කඩිනම් ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගෙන තිබේ. වීසා/මාස්ටර් කාඩ් අයකිරීම් ක්‍රියාවලියට අනුව, පාරිභෝගික ගිණුම්, රක්ෂණය හා වීසා/ මාස්ටර් කාඩ් සහායක සේවා ගනුදෙනුවලින් රු. මිලියන 713 ක් අයකර ගෙන ඇති අතර ශුද්ධ අලාභය රු. මිලියන 5 ට ආසන්න වී ඇත.

අදහස් දක්වා නැත.

**නිර්දේශය:**

වංචා අධීක්ෂණය කිරීමේ පද්ධතිය ශක්තිමත් කිරීම හා වැළැක්වීමේ පියවරලෙස අභ්‍යන්තර පාලන පද්ධතියට දැඩිව අනුගතවීම අවශ්‍ය වේ.

**3.3** **මෙහෙයුම්අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (ආ) බැංකුව 2020 වර්ෂය තුළදී රු.මිලියන 654,747 ක ණය ලබාදී තිබුණු අතර ඉන් රු.මිලියන 5,475 ක ණය 2021 සැප්තැම්බර් 30 වන විට අක්‍රිය ණය කාණ්ඩයට මාරු කර තිබුණි. ඉන් රු. මිලියන 202.9 ක ණයවලින් එක් වාරිකයක් හෝ අයකරගෙන නොතිබුණු අතර රු. මිලියන 174.1 ණයවලින් කිසිදු ප්‍රාග්ධන වාරිකයක් හා රු. මිලියන 28.7 ක ණයවලින් කිසිදු පොලී වාරිකයක් හෝ 2021 සැප්තැම්බර් 30 දිනට අයකර ගෙන නොතිබුණි. | පහත හේතුවල ප්‍රතිඵලයක් ලෙස, අක්වෙරළ බැංකු ඒකකවල රජයට හිමි ව්‍යාපාරවල ණය නිරාවරණය (exposure) 2021 දෙසැම්බර් 31 දිනටසියයට 64 ට අඩුවිය.<br>**a.**2021 වර්ෂය තුළදී ඇමෙරිකානු ඩොලර් මිලියන 471 (රු. මිලියන 94,553) ක භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ (DST) විදේශීය මුදල් ණය නිරවුල් කිරීම. මෙමගින් 2020 දෙසැම්බර් 31 දිනට පැවති ඇමෙරිකානු ඩොලර් මිලියන 650 වැඩි භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ විදේශීය මුදල් ණයදීම්, ඇමෙරිකානු ඩොලර් මිලියන 200 දක්වා අඩු කර ඇත.<br>**b.** 2021 ඔක්තෝබර් 7 දිනැති වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුවේ තීරණය පරිදි, ඇමෙරිකානු ඩොලර් මිලියන 716 ක ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හිඟ ණය ප්‍රාග්ධනය අක්වෙරළ බැංකු ඒකකවල සිට දේශීය බැංකු ඒකක වෙත මාරු කිරීම. මෙය වඩා හොඳ ද්‍රවශීලතා කළමනාකරණ | අකීය ණය සම්බන්ධයෙන් අඛණ්ඩ පසුවිපරම් කිරීම් අවශ්‍ය වේ. |

අරමුදුණු වෙනුවෙන් වන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ නිශ්කාශනයෙන් පසුව සිදු කරන ලදි.

c. 2021.12.31 දිනට මුළු හිඟඅක්‍රීය ණය, ඇමෙරිකානුඩොලර් මිලියන 39.68 (රු.මිලියන 7,967) ක් විය.අක්‍රීය ණය තත්ත්වය/තත්ත්වයන් කල් ඇතිව හා හැකිතරම් ඉක්මනින් අයකර/අඩුකර ගැනීමට අයකිරීම් දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ප්‍රයත්නයන් ගනිමින් සිටියි.

ආ. රජයට හිමි ව්‍යාපාරවලට අයත් ණය හා අත්තිකාරම් හිඟ ශේෂය රු. බිලියන 845 ක් වූ අතර එය බැංකුවේ මුළු ණය හා අත්තිකාරම්වලින් සියයට 49.02 ක් නියෝජනය විය. මෙය පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළදී රු. බිලියන 244 ක හෙවත් සියයට 40.50 ක වැඩිවීමක් පිළිබිඹු විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2020 දෙසැම්බර් 31 දිනට බැංකුවේ වත්කම් පදනම රු.බිලියන 2,230 දක්වා රු. බිලියන 357 කින් හෙවත් සියට 19.04 කින් වැඩි වුවද, සියයට 37.88 ක් රජයට හිමි ව්‍යාපාරවලට දුන් ණයවලින් නියෝජනය විය.

ඇ. 2020 දෙසැම්බර් 31 දිනට අක්වෙරළ බැංකු ඒකකවල ණය හා අත්තිකාරම් හිඟ ශේෂය රු. මිලියන 374,821 ක් වූ අතර ඉන් රු. මිලියන 329,445 ක් හෙවත් සියයට 87.89 ක් රජයට හිමි ව්‍යාපාරවලට අයත් වූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 76,501 ක හෙවත් සියයට 30.24 ක වැඩිවීමකි. එකතුව රු. මිලියන 9,086 ක් හෙවත් සියයට 2.42 ක් අක්‍රීය ණය ශේෂය ලෙස පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළදී මුළු අක්‍රීය ණය ශේෂය රු. මිලියන 524 කින් හෙවත් සියයට 6.12 කින් වැඩි විය. 2020 දෙසැම්බර් 31 දිනට අක්වෙරළ බැංකු ඒකකවල ඉහළම අක්‍රීය ණය හා අත්තිකාරම් ශේෂ 10 හි වටිනාකම, ප්‍රාග්ධනය රු. මිලියන 4,652 ක් හා පොලිය රු. මිලියන 4,382 ක්සමඟ රු.මිලියන 9,034 ක් වූ අතර එය ඉහත සඳහන් මුළු අක්‍රීය ණය වලින් සියයට 99 ක් නියෝජනය විය.

ඈ. 2020 දෙසැම්බර් 31 දිනට බැංකුවේ රු.මිලියන 5 ට වැඩි මුළු අක්‍රීය ණය, ප්‍රාග්ධන ශේෂය රු. මිලියන 33,000 ක් හා පොලිය

මෙහි සඳහන් කළ ආකාරයට ණයවලින්

| | |
|---|---|
| රු. මිලියන 34,381 ක් ඇතුළත්ව රු. මිලියන 67,381 ක් වූ අතර එය මුළු අක්‍රීය ණය හා බැංකු අයිරාවලින් සියයට 90 ක් විය. | රු. මිලියන 5ට වැඩි මුළු ශේෂයෙන්, ප්‍රාග්ධන ශේෂය රු.මිලියන 13,686 ක් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇති අතර ප්‍රාග්ධන ශේෂය රු.මිලියන 2,660 ක් අයකර ගැනීමට පරාටේ ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. ප්‍රාග්ධන ශේෂය රු.මිලියන 14,636 ක් අයකර ගැනීම සඳහා නිරවුල් කිරීම් දැනට සාකච්ඡා කරමින් පවතී. රු.මිලියන 2,202 ක ප්‍රාග්ධන ශේෂයක් 2022.01. 31 දිනට පියවන ලද හෝ සතුටුදායක කාර්යසාධනය හේතුවෙන් ක්‍රියාකාරී ලෙස වර්ගීකරණය කර ඇත. |
| ඉ. 2020 දෙසැම්බර් 31 දිනට බැංකුවේ රු.මිලියන 5 ට වැඩි මුළු අක්‍රීය බැංකු අයිරා ශේෂය, රු. මිලියන 4,053 ප්‍රාග්ධනයක් හා පොලිය රු. මිලියන 3,614 ක් සමඟ රු. මිලියන 7,667 ක් වූ අතර එය එය මුළු අක්‍රීය බැංකු අයිරා ශේෂයෙන් සියයට 53 ක් විය. . | මෙහි සඳහන් කළ ආකාරයට බැංකු අයිරාවන්ගෙන් රු. මිලියන 5 ට වැඩි මුළු ශේෂයන්ගෙන්, ප්‍රාග්ධන ශේෂය රු.මිලියන 1,160 ක බැංකු අයිරා අයකර ගැනීමට නීතිමය ත්‍රියාමාර්ග ආරම්භ කර ඇත. ප්‍රාග්ධන ශේෂය රු.මිලියන 2,483 ක් සඳහා නිරවුල් කිරීම් දැනට සාකච්ඡා කරමින් පවතින අතර රු.මිලියන 175 ක මුදලක් අයකර ගැනීමට පරාටේ ක්‍රියාමාර්ගය ගනිමින් සිටියි. 2022.01.31 වන විට රු.මිලියන 235 ක් වටිනා බැංකු අයිරා ක්‍රියාකාරී හෝ පියවන ලද ලෙස දැනටමත් වර්ගීකරණය කර ඇත. |

ඊ.2020 දෙසැම්බර් 31 දිනට ඉහළම අක්‍රීය ණය 10 හි මුළු හිඟ ශේෂය, ප්‍රාග්ධනය රු.මිලියන 21,902 ක් හා පොලිය රු.මිලියන 25,463 ක් සහිතව රු.මිලියන 47,366 ක් වූ අතර එය මුළු දළ අක්‍රීය ණය හා අත්තිකාරම් ශේෂයෙන් සියයට 40.75 ක් විය. එම ශේෂයෙන් රු.මිලියන 26,652 ක් හෙවත් සියයට 56.3 ක් සඳහා කිසිදු සුරැකුමක් නොමැති අතර රු. මිලියන 2,235 ක් හෙවත් සියයට 4.7 ක් සඳහා ප්‍රමාණවත් සුරැකුම් නොමැත.

ඉහළ විශාලතම අක්‍රීය ණය 10 හි ගනුදෙනුකරුවන්ගෙන් අයකරගැනීමේ ක්‍රියාමාර්ගවල වර්තමාන තත්ත්වය සම්බන්ධ විස්තර සපයා ඇත.

| අංකය | ගනුදෙනුකරුගේ නම | ප්‍රාග්ධන ශේෂය | පොලිය | මුළු ශේෂය |
|---|---|---|---|---|
| | | රු.මි. | රු.මි. | රු.මි. |
| 01 | CML GROUP | 3,596 | 1,084 | 4,680 |
| 02 | THE GRAND MOUNTAIN GROUP | 3,136.9 | 427 | 3,563.9 |
| 03 | W M MENDIS AND COMPANY LTD | 3,063 | 812.7 | 3,875.7 |
| 04 | YASHODA GROUP | 3,030.4 | 20,950.2 | 23,980.6 |
| 05 | MIHIN LANKA(PVT) LTD | 2,500.5 | 1.5 | 2,502 |
| 06 | HURAVEE INTERNATIONAL PVT LTD | 1,785 | 393.8 | 2,179 |
| 07 | DAYA APPERAL GROUP | 1,159.8 | 783.4 | 1,943.2 |
| 08 | NAWALOKA GROUP | 1,577.4 | 121.8 | 1,699.3 |
| 09 | GOOD FELLOWS (PVT) LTD | 1032.5 | 872.7 | 1905.3 |
| 10 | CITY CONSTRUCTION CONTRACTORS (PVT) LTD | 1,020.9 | 15.5 | 1,036.5 |

ඊ. 2020 වර්ෂය තුළදී ප්‍රතිව්‍යුහගත කර/ ප්‍රතිලේඛන ගත කර අක්‍රීය ණවලට මාරු කරන ලද ඉහළම අක්‍රීය ණය 10 හි 2020 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ශේෂය, ප්‍රාග්ධන ශේෂය රු. මිලියන 1,067 ක් හා පොලිය රු. මිලියන 16.4 ක් ඇතුළත්ව රු. මිලියන 1,084 ක් වූ අතර එය මුළු දළ අක්‍රීය ණය හා අත්තිකාරම්වලින් සියයට 1.99 ක් විය. ඉහත අත්තිකාරම්වලින් රු. මිලියන 350 ක් හෙවත් සියයට 32.30 ක් සඳහා කිසිදු සුරැකුමක් නොතිබුණි.

a) EAST WEST MARKETING (PRIVATE) LIMITED අධ්‍යක්ෂවරුන්ගේ පුද්ගලික ඇපදීර්ග කරන ලද අතර අපි පුද්ගලික ඇප සුරැකුම් ලෙස සලකා ඇත. ජයන්ත ධර්මදාස මහතා හා

| අංකය | ගනුදෙනුකරුගේ නම | ප්‍රාග්ධන ශේෂය | පොලිය | මුළු ශේෂය |
|---|---|---|---|---|
| | | රු.මි. | රු.මි. | රු.මි. |
| 01 | CITY CONSTRUCTION CONTRACTORS (PVT) LTD | 786.7 | 15.1 | 801.8 |
| 02 | CEYLINCO SUSSEX EDUCATIONAL SERVICES LTD | 61.9 | 0.2 | 62.2 |
| 03 | MICRO ENTERPRISES | 43.9 | - | 43.9 |
| 04 | ARIYAPALA | 31.9 | - | 31.9 |
| 05 | KUMARAGE | 27.7 | - | 27.7 |
| 06 | EAST WEST MARKETING (PRIVATE) LIMITED | 26.2 | 0.1 | 26.3 |
| 07 | D M JEEWAN PVT LTD | 25.8 | 0.1 | 25.9 |
| 08 | NEW PAL PACKAGING (PVT) LTD | 24.9 | 0.8 | 25.7 |
| 09 | DUMINDA BUILDERS PVT LTD | 21 | 0.01 | 21.03 |
| 10 | ZULFIKAR | 17.5 | - | 17.5 |

යූ.එච්.ධර්මදාස මහතා ඉහළ පිළිගැනීමක් ඇති පුද්ගලයෝ වෙති. නීතිමය ක්‍රියාමාර්ග ඇරඹූ විට සුරැකුම් උපලබ්ධි කර ගත හැකිය. එබැවින්, මෙම පහසුකම ද සුරක්ෂිත ලෙස සලකනු ලැබිය හැකිය.

b) NEW PAL PACKAGING (PVT) LTD සියලු ණය පහසුකම් දේපළ උකස්කිරීම මඟින් සුරක්ෂිත කර ඇති අතර සියලු පහසුකම් සඳහා උකස් බැඳුම්කර දැනටමත් ලබාගෙන ඇත.

උ. 2016 සිට 2020 දක්වා අක්‍රිය ණය හා අත්තිකාරම්වලින් රු. මිලියන 645.51 ක සමුච්චිත මුදලක් කපාහැර/අත්හැර තිබුණු අතර 2020 වර්ෂය තුළදී රු. මිලියන 195.7 ක් කපාහැර/අත්හැර තිබුණි.

කපාහැර තිබුණ ද, බැංකුවේ කළමනාකරණය/අයකිරීම් දෙපාර්තමේන්තුව පසුකාලීනව එම කපාහළ මුදලින් කොටසක් අයකරගැනීමට සමත් විය.

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රසිද්ධ කරන ලද මූල්‍ය ප්‍රකාශනවල විශ්ලේෂණයට අනුව, බැංකුවේ ශුද්ධ මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් ලෙස සේවක මණ්ඩල වියදම් සියයට 32.79 ක් වූ අතරඑය, ලංකා බැංකුව, කොමර්ෂල් බැංකුව, සම්පත් බැංකුව හා හැටන් නැෂනල් බැංකුව වැනි වෙනත් වාණිජ බැංකුවල වාර්තා කළ සියයට 27.24 සිට සියයට 29.72 ක පරාසය සමඟ සැසඳීමේදී ඉහළම අගය නියෝජනය විය. එය, එක් සේවකයකු ලාභයට දක්වන දායකත්වය අඩුවීමට හේතු විය. | අදහස් දක්වා නැත. | සේවකයන්ගේ කාර්යක්ෂමතාවය වැඩිකරන අතරතුර බැංකුවේ අරමුදල් සඵලදායීව භාවිතා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අවශ්‍ය වේ. |